- දුවේ, පුතේ වැඩිහිටියන් සමග එකතු වී බුද්ධාගම පොතේ 17 පාඩම කියවන්න සූදානම් වෙමු.

"වඩමු ගුණ දම්" පාඩමේ නම
දැන් ශබ්ද නගා පාඩම හොඳින් කියවමු.

වාචිකව පිළිතුරු දෙන්න.

01. දුවේ, පුතේ; ලද දෙයින් සතුටට පත් වීම කියන්නේ කුමක්ද ?

02. පන්තියේදී යහළුවෝ පාවිච්චි කරන දේවල් දිහා බලලා ඒ වගේම දේවල් ඉල්ලලා අපි දෙමාපියන්ට කරදර කරනවද ? පුතේ, දුවේ

03. අම්මා, තාත්තා බොහොම අමාරුවෙන් අපට සපයා දෙන පාසැල් උපකරණ අපි කොහොමද පාවිච්චි කරන්නේ ? දුවේ, පුතේ

04. හොඳ යාළුවෙක් ළඟ තිබෙන හොඳ ගුණාංග අපි පාඩමෙන් සොයා බලමු

පිළිතුරු ලියන්න

01. හොඳ යාළුවෙක් ළඟ තිබෙන ගුණාංග 3 ක් ලියන්න

02. ඔබ කැමති සුභාෂිත වචන 5 ක් ලියා කොටු කර පාට කරන්න

03. යාවවන්ගේ ඇසුර නිසා වෙනස්වන ආකාරය ගැන කියැවෙන සත්තිකුම්බ ජාතක කතාව දෙමාපියන්ගෙන් අසා දැනගන්න

දුවට, පුතාට තෙරුවන් සරණයි !